# වාග්විද්‍යා අධ්‍යයන අංශය

මහාචාර්ය ආර්.එම්.ඩබ්ලිව්. රාජපක්ෂ

## හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලයෙහි වාග්විද්‍යා අධ්‍යයන අංශයෙහි ඉතිහාසය සැකෙවින් ඉදිරිපත් කිරීම ලිපියේ අරමුණයි. ආරම්භයක් වශයෙන් මෙරට වාග්විද්‍යාත්මක භාෂා අධ්‍යයන ආරම්භ වූ ආකාරය, විකාශනය, වාග්විද්‍යාව මෙරට විෂය ධාරාවට ඇතුළත් වීම ආදී කරුණු ද මෙහි දී කෙටියෙන් සාකච්ඡා කිරීම අවශ්‍ය ය.

## නූතන වාග්විද්‍යාව

භාෂා අධ්‍යයන මීට අවුරුදු දහස් ගණනකට පෙර සිට භාරතය, ග්‍රීසිය, චීනය වැනි රටවල ආරම්භ වුව ද නූතන වාග්විද්‍යාව හෙවත් වාග්විද්‍යාවේ නව මුහුණුවර ෆර්ඩිනාන්ද් දි සොසූර්යෝගේ අධ්‍යයන ඇතුළත් 'Course de Linguistique Generale' නම් කෘතිය 1916 දී ප්‍රකාශයට පත්වීමෙන් අනතුරුව සකස් වූ බව සාමාන්‍ය පිළිගැනීමයි. සොසූර්යෝ නූතන වාග්විද්‍යාවේ පියා හැටියට සැලකෙනුයේ ද එහෙයිනි. සොසූර්යෝගේ නව වාග්විද්‍යාත්මක අදහස් ඉදිරිපත් වූ අවධියේ ම ඒ පිළිබඳ දැනුමක් ශ්‍රී ලංකාවේ ඇතැම් වියතුන්ට ලැබුණු බව ඉතිහාසයෙන් පෙනේ. මෙම සියවසේ මුල් දශකයේ දී අධ්‍යයන කටයුතු සඳහා මහා බ්‍රිතාන්‍යයට ගිය එස්. එච්. පෙරේරා නැමති ශ්‍රී ලාංකික ශිෂ්‍යයකු එවක එරට විසූ මුල් පෙළේ වාග්විද්‍යාඥයකු වන ඩැනියෙල් ජෝන්ස් මහතාගේ උපදේශකත්වයෙන් භාෂා අධ්‍යයන කළ බව සඳහන් වේ. ඔහු සිය රටට පැමිණි පසු ප්‍රථම වරට නූතන වාග්විද්‍යාත්මක මූල ධර්ම මත පදනම් වූ භාෂා අධ්‍යයන ආරම්භ කළ බව ද සඳහන් වේ.

විශ්වවිද්‍යාල මට්ටමින් වාග්විද්‍යාත්මක අදහස් ප්‍රචලිත වීම ආරම්භ වූයේ යුරෝපීය රටවල වාග්විද්‍යාත්මක අධ්‍යයන පිළිබඳ දැනුමක් ලැබූ පී. බී. එෆ්. විජේරත්න, මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි, ඩී. ජේ. විජේරත්න යන විද්වතුන් කොළඹ හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවල වාග්විද්‍යාත්මක සංකල්ප විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ඉගැන්වීමෙන් අනතුරුව ය. කෙසේ නමුත් නූතන වාග්විද්‍යාව මුල්වරට ලක්දිව විශ්වවිද්‍යාලයක ඉගැන්වූයේ මහාචාර්ය සුගතපාල